# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1888/14 – 2014 නොවැම්බර් 11 වැනි අඟහරුවාදා – 2014.11.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟඉහළ කෝරළයේ, සුළු කොට්ඨාසයේ, මියනගොල්ල ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් 2014.05.20 දින පිළියෙල කරන ලද අංක මහ/ජීඑල්කේ/2012/648 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' සහ 'බී' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 51.7976ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස් දෙක:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගලමුදුන වත්ත – ප්‍රමාණය: හෙක්. 48.3028**
උතුරට: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගලමුදුන වත්ත සහ මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.), පාර සහ කහවත්ත වැවිලි සමාගම හිමිකම් කියන ගලමුදුන වත්ත; දකුණට: කහවත්ත වැවිලි සමාගම හිමිකම් කියන ගලමුදුන වත්ත සහ හිමිකම් කියන අය නොදන්නා ලෙව්දෙනිය; බටහිරට: හිමිකම් කියන අය නොදන්නා ලෙව්දෙනිය සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන ගලමුදුන වත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ගලමුදුන වත්ත – ප්‍රමාණය: හෙක්. 3.4948**
උතුරට: මාර්ගය (මා.සං.අ.); නැගෙනහිරට: මාර්ගය (මා.සං.අ.) සහ මා ඔය; දකුණට: කහවත්ත වැවිලි සමාගම හිමිකම් කියන ගලමුදුන වත්ත සහ පාර; බටහිරට: පාර.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංක: 4/3/2/2011/එල්ආර්/30.
2014 සැප්තැම්බර් මස 01 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

11 - 760

1A – G 20579– 15 (2014/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*